" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01
SLSI ISO 9001

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2023 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.12.29 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-I හා 2023.12.20 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2023.12.07<br>රා.ප.චක්‍රලේඛ 22/2023 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2024 වසර |
| 02 | 2023.12.15<br>රා.ප.චක්‍රලේඛ 25/2023 | 2024 වසර - රාජකාරී කටයුතු ඇරඹීම |
| 03 | 2023.11.30<br>රා.ප.චක්‍රලේඛ 02/2018(I) | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන : 0112-092607
ෆැක්ස් : 0112-092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 25/2023

මගේ අංකය : EST-01/MISCL/06/0032(II)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.12.15

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2024 වසර - රාජකාරි කටයුතු ඇරඹීම

"සවිමත් අනාගතයකට පෙරවදනක්"යන තේමාව යටතේ, වත්මන් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට අනුකූල නව ආර්ථික ක්‍රමවේදයකට පදනම සපයමින් ගරු ජනාධිපතිතුමන් විසින් 2024 වර්ෂය සඳහා වන අයවැය ඉදිරිපත් කරමින් ගෙන හැර දක්වන ලද කරුණු තුළින්, එළඹෙන 2024 වර්ෂය, රාජ්‍ය සේවයේ නියුතු අප සැමට නවමු අපේක්ෂාවන් ඇති කරනු ඇත.

02. ආර්ථිකයේ ඇති වූ පසුබෑම තුළ වුව ද, රාජ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය සේවකයින් විසින් දැක් වූ කැපවීම ප්‍රශංසනාත්මකව සිහිපත් කරන අතර, ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා වන කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් යටතේ දිළිඳුකම පිටුදැකීම, විරැකියාව අඩු කිරීම, දේශීය නිෂ්පාදන වැඩි දියුණු කිරීම සහ විදේශ විනිමය ඉපැයීම ඉහළ දැමීම ආදිය සඳහා රාජ්‍ය සේවයේ ඔබ සැමගේ සක්‍රීය දායකත්වය හා කැපවීම තවදුරටත් අවශ්‍යව ඇත.

03. ඉතිහාසයේ කිසි දිනෙක අත් නොදුටු ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් ඉදිරියට ගමන් කරන මෙම කාල පරිච්ඡේදයෙහි ලෝකයේ ආර්ථික අර්බුදයන්ට මුහුණ දුන් රටවල් එම අභියෝගයන් ජය ගැනීමට හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ පිළිබඳව අධ්‍යයනය කරමින්, මහජන සේවා සැපයීමේ කාර්යක්ෂමතාව තහවුරු කරනු ලබන අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ රාජ්‍ය සේවයට හඳුන්වා දෙමින්, රජයේ වියදම් අඩු කිරීම හා රාජ්‍ය ආදායම් වැඩි කර ගැනීම කෙරෙහි ඔබ සැමගේ අවධානය පෙරටත් වඩා යොමු කළ යුතු ය.

04. 2024 වසරේ රාජකාරි ඇරඹෙන පළමු දිනය වන ජනවාරි මස 01 වන සඳුදා දින සියලු ම රාජ්‍ය සේවකයින්ගේ සහභාගීත්වයෙන් සිය සේවා ස්ථානයන්හි රාජකාරි කටයුතු ආරම්භ කිරීමේ නිල උත්සවය පැවැත්විය යුතු ය. එහි ප්‍රධාන නිල උත්සවය එදින පෙ.ව. 9.00ට ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත් වේ. මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහා සමස්ත රාජ්‍ය සේවය ම ඒ සඳහා තිර අදිටනින් කැපවිය යුතු බැවින් ඊට සමගාමීව එදින එම වෙලාවට ම පහත දැක්වෙන වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටම් නියෝජනය කරන සියලු ම රාජ්‍ය ආයතන හා කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙල යොදා ගත යුතු වේ.

I. ජාතික ධජය එසවීම හා ජාතික ගීය ගායනා කිරීම.

II. රණවිරුවන් ඇතුළු දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු ම දෙනා සැමරීම සඳහා විනාඩි දෙකක (02) නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

III. සියලු ම කාර්යය මණ්ඩල සමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් තම ස්ථානවල සිට මේ සමඟ එවා ඇති රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නගා කියවීම.

IV. වත්මන් අභියෝග ජය ගැනීම සඳහා හඳුන්වා දී ඇති රාජ්‍ය ප්‍රතිපත්තීන් හා වැඩපිළිවෙල පිළිබඳව හා එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සේවකයාගේ දායකත්වය පිළිබඳව ඔවුන් අභිප්‍රේරණය කරමින් කෙටි දේශනයක් පැවැත්වීම.

05. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දු.ක. - 011-2662340
ෆැක්ස් - 011-2692158
විද්‍යුත් තැපැල - ade-i@pubad.gov.lk

පිටපත් -:
1. ගරු පළාත් ආණ්ඩුකාරවරුන් - කාරුණික දැනගැනීම සඳහා
2. ජනාධිපති ලේකම් - අවශ්‍ය කටයුතු සඳහා
3. අග්‍රාමාත්‍ය ලේකම් - අවශ්‍ය කටයුතු සඳහා
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - අවශ්‍ය කටයුතු සඳහා
5. විගණකාධිපති - අවශ්‍ය කටයුතු සඳහා

<u>**රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/ දිවුරුම**</u>

දෙදහස් විසි හතර වර්ෂයේ රාජකාරි අරඹන පළමු වැනි දිනය වන අද දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ලක් වැසි ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කරන නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ, එක කොඩියක සෙවණේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන

සුරක්ෂිත වූ අපගේ මාතෘ භූමිය තුළ

"සව්මත් අනාගතයකට පෙරවදනක්" යන තේමාව පෙරදැරිව

සෞභාග්‍යවත් රාජ්‍යයක් ලෙස

තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගනිමින්

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකරලීමට,

කාර්යක්ෂම මානව සම්පතක් හිමි

රාජ්‍ය පාලනයක කොටස්කරුවෙකු වශයෙන්,

මම

මහජන මුදලින් වැටුප් ලබන රජයේ සේවකයෙකු ලෙස

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.